[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 08 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................................

### I කොටස

**අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01). ජනතාවගේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන්නේ,
1). සෞඛ්‍ය සේවාවන් ය 2). අභියෝගයන් ය
3). පොදු සේවාවන් ය 4). ආරක්ෂක සේවාවන් ය

02). “මිනිසා විසින් අත්පත් කරගන්නා වූත් ලබා ගන්නා වූත් දැනුම විශ්වාස කලා සදාචාර හා වෙනත් සමස්තය සංස්කෘතිය” යයි පැවසුවේ,
1). සෙනරත් පරණවිතාන මහතා ය 2). J.B.දිසානායක මහතා ය
3). C.W.W කන්නන්ගර මහතා ය 4). E.B. ටයිලර් මහතා ය

03). බහු සංස්කෘතික සමාජයක් පවතින රටක හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ,
1). එකම ජාතියක් පමණක් සිටීමය. 2). විවිධ ජාතින් ජීවත් වීමයි.
3). ජනවර්ග අතර සමානතා දක්නට ලැබීමයි. 4). එකම සංස්කෘතියක් පැවතීමයි.

04). මිනිසාට මුහුණ දීමට සිදුවන ස්වභාවික විපත් යටතට ගැනෙන කරුණක් වන්නේ,
1). ඩෙංගු උවදුර 2). ගංවතුර හා නියඟය
3). න්‍යෂ්ටික පිපිරීම් 4). පානීය ජල හිඟය

05). ආපදා ඇතිවීම සම්පූර්ණයෙන්ම නැවැත්විය නොහැකි වුවත් ඇතිවන හා ඇතිවිය හැකි හානි අවම කරගත හැකිය. මෙම ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,
1). ආපදා අවම කිරීම යනුවෙනි. 2). ආපදාවලට මුහුණ දීම යනුවෙනි.
3). ආපදා කළමනාකරණය නමිනි. 4). ආපදා වැළැක්වීම යනුවෙනි.

**ප්‍රශ්න අංක 06 - 10 දක්වා හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

06). ළමයින් තම ..................................... භුක්ති විඳින සෑම අවස්ථාවකම තම යුතුකම් ඉටු කිරීමට ද වග බලා ගත යුතුය.

07). ශ්‍රේෂ්ඨ ..................................... යනු අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් නොවේ.

08). ඕනෑම සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය වන්නේ ........................................................ යි.

09). ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු වශයෙන් ........................................... සුබවාදීව හසුරුවා ගත යුතුය.

10). ........................................... නොසැලකිලිමත්කම ද මාර්ග අනතුරුවලට බොහෝ දුරට හේතු වේ.

(සංස්කෘතිය, චිත්තවේග, අයිතිවාසිකම්, පදිකයන්ගේ, නායකත්වය)

**අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් ✗ ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11). ප්‍රජාතන්ත්‍රවාදය පැලන ක්‍රමයක් මෙන්ම ජීවන ක්‍රමයක් ද වේ. ( )

12). විරිත් යනු අප විසින් ඉටු කරනු ලබන චාරිත්‍ර වේ. ( )

13). වගුරු බිම් ගොඩ කිරීම ගංවතුර තර්ජනයක් පිළියමකි. ( )

14). යම් ගැටලුවක් සඳහා විකල්ප විසඳුම් රැසක් තිබිය නොහැක. ( )

15). ජපන් වැසියන් තම කටයුතු බොහෝමයක් ඉටු කරගැනීමට පාපැදිය භාවිතා කරයි. ( )

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරන්න.**

| A | B |
|---|---|
| 16). ජන සමාජයේ සුරක්ෂිත පැවැත්මට ඇති ප්‍රබලම අභියෝගයකි. | සුවඳිවි මධ්‍යාස්ථාන |
| 17). ස්වභාවික සංසිද්ධියකි. | ග්ලයිෆොසේට් |
| 18). බෝනොවන රෝග වැළැක්වීම සඳහා කටයුතු කරයි. | ස්වභාවික විපත් |
| 19). එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල හඳුන්වන කෙටි නාමයයි. | අකුණු |
| 20). රසායන ද්‍රව්‍ය වල අඩංගු සංඝටකයකි. | යුනිසෙෆ් |

**(ලකුණු 2 ✗ 20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **තවත් ප්‍රශ්න 4ක් තෝරා ගෙන පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5කි.**

01)

I). නිදහස අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ කාට ද?

II). අධ්‍යාපනය මඟින් ඉටු කරන කාර්යයන් දෙකක් දක්වන්න.

III). ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවාවන් දෙකක් නම් කරන්න.

IV). මාධ්‍ය මඟින් ඉටු කෙරෙන සේවාවන් දෙකක් නම් කරන්න.

V). පරිසර සංරක්ෂණ සඳහා රජය මඟින් පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.

VI). අයහපත් චිත්තවේග සාධනය සඳහා ගත හැකි නිසා මාර්ග දෙකක් නම් කරන්න.

VII). හින්දු ආගම හා බැඳුණු සංස්කෘතික උත්සව දෙකක් නම් කරන්න.

VIII). රසායනික ද්‍රව්‍ය ශරීර ගත විය හැකි ක්‍රම දෙකක් නම් කරන්න.

**(ලකුණු 2 × 8 = 16)**

02)

I). අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). A.පොදු සේවා මහජනයා වෙත සපයන ආකාර දෙකක් නම් කරන්න.

B.පොදු සේවාවල අවශ්‍යතාවයන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III). A - පොදු සේවා මහජනයා වෙත සපයන ආකාරය අනුව වර්ග තුනකට බෙදේ. එම කොටස් තුන නම් කරන්න.

B - ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

03)

I). බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පිහිටුවා ඇති රෝහල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). බෝනොවන රෝග හතරක් නම් කරන්න. (ලකුණු 04)

III). සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මඟින් ඔබ ප්‍රදේශයට සපයන සේවාවන් පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

04)

I). පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). ළමා අයිතිවාසිකම් ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ග කර ඇත.
ඒවා නම් කරන්න. (ලකුණු 04)

III). ළමයින් තම අයිතිවාසිකම් භුක්ති විඳින හැම අවස්ථාවකට තම යුතුකම්
ඉටු කිරීමට වගබලා ගත යුතුය. ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් පහක් නම් කරන්න. (ලකුණු 05)

05)

I). පාසල තුළ නායකත්ව ලක්ෂණ දැකිය හැකි අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). නායකයකු සතු විය යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)

III). යම් ජන සමාජයක් මෙහෙයවීමට නායකත්වය අත්‍යවශ්‍ය වේ.
නායකයකු අවශ්‍ය වීමට හේතු පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

06)

I). බහු සංස්කෘතික සමාජයක් දක්නට ලැබෙන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). බහු සංස්කෘතික ජන සමාජයක ලබන හතරක් නම් කරන්න. (ලකුණු 04)

III). බහු සංස්කෘතික වන සමාජයක ජීවත් වීමේ දී අප අනුගමනය කළ යුතු ගුණාංග
පහක් නම් කරන්න. (ලකුණු 05)

07).

I). පෘථිවි පරිසර පද්ධතිය තුළ විපත් ඇතිවීම ස්වභාවික සංසිද්ධියකි. එසේ ඇතිවිය
හැකි ස්වභාවික විපත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). අනතුරු හා ආපදාවලදී සහාය ලබා ගත හැකි ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 04)

III). ස්වභාවික විපත් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පහක් නම් කරන්න. (ලකුණු 05)

08).

I). මිනිස් අවශ්‍යතා බොහෝය. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III). තිරසර සංවර්ධනය ඇති කිරීමට අප සියලු දෙනාම දායක විය යුතුය.
එහිදී සැලකිලිමත් විය යුතු කරුණු පහක් නම් කරන්න. (ලකුණු 05)

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 8 ශ්‍රේණිය | විෂයය – පුරවැසි අධ්‍යාපනය | පිළිතුරු |
|---|---|---|

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | පොදු සේවාවන් ය. | 11. | ✓ |
| 02. | E. B. ටයිලර් මහතා ය. | 12. | ✗ |
| 03. | විවිධ ජාතීන් ජීවත් වීමයි. | 13. | ✗ |
| 04. | ගංවතුර හා නියඟය | 14. | ✗ |
| 05. | ආපදා කළමනාකරණය නමිනි. | 15. | ✓ |
| 06. | අයිතිවාසිකම් | 16. | ස්වභාවික විපත් |
| 07. | නායකත්වය | 17. | අකුණු |
| 08. | සංස්කෘතිය | 18. | සුවදිවි මධ්‍යස්ථාන |
| 09. | චිත්තවේග | 19. | යුනිසෙෆ් |
| 10. | පදිකයන්ගේ | 20. | ග්ලයිෆොසේට් |

## II කොටස

01. I. I) C.W.W. කන්නන්ගර මැතිතුමා

II) නව දැනුම ලබාදීම / සමාජානුයෝජනය කිරීම / යහපත් පුරවැසියන් බිහි කිරීම / ජාතික සමගිය පෝෂණය

III) සිසු සැරිය / ගැමි සැරිය

IV) එදිනෙදා වැදගත් සිදුවීම් ජනතාව දැනුවත් කිරීම.

දැනුම වර්ධනය, රසවින්දනය, විනෝදය සඳහා වැඩසටහන් ඉදිරිපත් කිරීම.

V) පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

VI) මනස සන්සුන් කිරීමේ අභ්‍යාස, මිතුරන් ඇසුර, නිර්මාණකරණය සඳහා යොමු වීම.

VII) තෛපොංගල්, දීපවාලී, මහා ශිව

VIII) සමෙහි ස්පර්ශ වීමෙන්, ආශ්වාසයෙන්, මුඛය මගින්, ආහාර මගින්

02. I) අධ්‍යාපනය සෞඛ්‍ය, ප්‍රවාහනය, විදුලිය, ජල සම්පාදනය

II) * ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීමට

* ජීවන තත්වය යහපත් කිරීම.

* අඩු ආදායම් ලාභීන්ට සහන සැලසීම.

III) * නොමිලයේ සපයන පොදු සේවා

* සහනදායී අය කිරීමේ පදනම මත සපයන පොදු සේවා

* මුදල් අයකර සපයන පොදු සේවා

03. I) ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, දිස්ත්‍රික්/මූලික රෝහල්

II) හෘද රෝග, දියවැඩියාව, වකුගඩු රෝග / පිළිකා

III) * බෝවන රෝග මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

* බෝවන රෝග වැලැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

* සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

* ළදරු හා මාතෘ සායන / එන්නත් ලබාදීම.

04. I) ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම.

සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.

අන්මත ඉවසීම, සමානාත්මතාවය, නායකත්වය ආදිය

II) * පැවැත්මට ඇති අයිතිය

* ආරක්ෂාවට ඇති අයිතිය

* සහභාගීත්වයට ඇති අයිතිය

* සංවර්ධනයට ඇති අයිතිය

III) * හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වීම.

* ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම.

* තම හැකියාවන් වර්ධනය කර ගැනීම.

* වැඩිහිටියන් ගරු කිරීම.

* පාසලේ නීතිරීති ආරක්ෂා කිරීම.

05. I) විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති, අංශ ප්‍රධාන, පන්ති නායක/ශිෂ්‍ය නායක

II) සන්නිවේදන, ගැටලු විසඳීම, මෙහෙයවීම, සැලසුම් කිරිම.

III) * නිවැරදි දර්ශනයක් සහිතව සංවිධානය ගොස් තිබීම.

* ඉලක්ක නිර්මාණය

* සම්පත් නිසිලෙස බෙදී යාම.

* ගැටලු විසඳීමට

* නියමිත පරිදි සැලසුම් කිරීම.

06. I) ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය

II) * විවිධ ජන වර්ග ජීවත් වීම.

* විවිධ ආගම් අදහනු ලබන ජන කොටස්

* විවිධ භාෂා කථා කිරීම.

* විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම.

* විවිධ සංස්කෘතික උරුම පැවතීම.

III) * සැම ජන වර්ගයකටම අයත් පුද්ගලයන්ට ගරු කිරීම.

* අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

* සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම.

* මතවාද අදහස් පිළි ගැනීම. /

* තම යුතුකම් ඉටු කිරීම.

07. I) ගංවතුර, නියඟ, භූ කම්පන, කුණාටු

II) * ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන, පොලිසිය, රෝහල, හමුදාව

III) * වනාන්තර විනාශ නොකිරීම.

* කැලෑ ගිනි නොතැබීම.

* දිරාපත් නොවන ද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමක් වැලකීම.

* කඩොලාන ශාක ආරක්ෂාවේ.

* ගංගාවලින් අවිධිමත් ලෙස වැලි ගොඩ නොදැමීම.

08. I) * ආහාර, ඇඳුම්, නිවාස, ජලය හා විදුලිය, අධ්‍යාපනය

II) * රියදුරන් අතින් සිදුවන වැරදි

* පදිකයන් අතින් සිදුවන වැරදි

* මාර්ගවල අඩුපාඩු

* වාහනවල නුසුදුසු තත්වය

III) * සම්පත් අධි පරිභෝජනයෙන් වැලකීම.

* පරිසර හිතකාමී ජීවන රටාවකට හුරුවීම.

* රටේ පවතින නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම.

* සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය

* පරිසර හිතකාමී ජීවන රටාව



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න